




# සුනාමියෙන් ආරක්ෂා වෙමු







**2004 දෙසැම්බර් 26 . . .** ඉන්දියන් සාගරයේ උතුරු සුමාත්‍රා දිවයිනේ බටහිර වෙරළට ඔබ්බෙන් ශ්‍රී ලංකාවේ වේලාවෙන් පෙ.ව. 6.58 ට රික්ටර් මාපාංක 9.0 ක ප්‍රබලතාවයක් සහිතව අති ප්‍රබල භූමිකම්පාවක් ඇතිවිය. මෙමගින් උත්පාදනය වුනු සුනාමි තරංග ප්‍රවාහය, ආසියා-අප්‍රිකා මහාද්වීපයන්හි ලක්ෂ තුනකට ආසන්න ජීවිත සංඛ්‍යාවක් බිලිගත් අතර සිදුවුනු දේපල හානිය අති විශාලය. මෙම ව්‍යසනයට බඳුන්වූ රටවල් අතුරින් ශ්‍රී ලංකාවට සිදුවුනු හානිය දෙවෙනි වන්නේ ඉන්දුනීසියාවට පමණක් වන අතර ශ්‍රී ලංකාවේ සිදුවුනු ජීවිත හානි ප්‍රමාණය 35,000 කට වඩා අධික විය.




| ගැඹුර (මී) | වේගය (කි.මී./පැයට) | තරංග ආයාමය (කි.මී.) |
|---|---|---|
| 7000 | 943 | 282 |
| 4000 | 713 | 213 |
| 2000 | 504 | 151 |
| 200 | 159 | 48 |
| 50 | 79 | 23 |
| 10 | 36 | 11 |

## ඔබ සුනාමියෙන් ආරක්ෂා වීමට නම්...

- අනතුරු ඇඟවීමක් ලද විගස හැකි ඉක්මනින් මුහුදු වෙරළාසන්නයෙන් ඉවත්වන්න. අසල් වැසියන්ටත් පණිවිඩය ලබා දෙන්න. සුදුසුම ආරක්ෂිත ස්ථානය මුහුදු මට්ටමට වඩා අවම වශයෙන් අඩි 30 ක් වත් උස කඳු ගැටයකි. එවන් ස්ථානයක් නොවන්නේ නම් සවි ශක්තිය ඇති උස් ගොඩනැගිල්ලක අවම වශයෙන් දෙවන මහලවත් තෝරා ගන්න.
- අනතුරු ඇඟවීම ලැබීමෙන් පසු බඩු බාහිරාදිය ආදී දේ ගැන අවධානය යොමු කරමින් ප්‍රමාද වීමෙන් වලකින්න.
- මුහුදු ජලය ආපසු ගමන් කිරීමක් පෙන්නුම්කරන අවස්ථාවන්හිදී එය ස්වාභාවික අනතුරු ඇඟවීමක් ලෙස සලකා වහා ආරක්ෂිත ස්ථානයක් කරා ගමන් කරන්න.
- මුල් රළ ප්‍රහාරයෙන් පසු ආරක්ෂිත ස්ථානයෙන් ඉවත් නොවන්න. අනතුර සම්පූර්ණයෙන්ම පහව ගොස් ඇති බැව් දැනුම් දෙන තුරු ආරක්ෂිත ස්ථානයේ රැඳී සිටින්න.
- හැකියාවක් ඇත්නම් ගුවන් විදුලිය මගින් නිකුත් කෙරෙන අනතුරු ඇඟවීම් වලට නිරතුරුව සවන් දෙන්න.
- සුනාමි රළ පෙල පැමිණෙන තුරු බලා නොසිටින්න.






## ඔබ වෙරළ තීරයේ හෝ ඒ ආසන්නයේ පදිංචිව සිටී නම්...

- ඔබ නිවසට ආසන්නතම සුනාමි ආරක්ෂිත ස්ථානයක් හඳුනා ගන්න.
- අදාල ආරක්ෂිත ස්ථානයට යා හැකි කෙටිම ගමන් මග සොයා ගන්න.



මුහුදු පත්ලේ ඇතිවන ප්‍රබල භූකම්පන සුනාමි ඇතිවීමට හේතු විය හැක.

හදිසි ඇමතුම්ශ්‍රී සුනාමි පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවල දුරකථන අංක (011) 2 686 686

කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අන්තර් ජාතික සුනාමි තොරතුරු මධ්‍යස්ථානය සමගින් නිකුත් කරන ලදී.